**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

දෙවන වාර පරීක්ෂණය - 2025

**11 ශ්‍රේණිය**

**සිංහල භාෂාව හා සාහිත්‍යය -III**

නම/විභාග අංකය.................................          කාලය : පැය 2යි

- අපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **<u>පහකට පමණක් උත්තර සපයන්න.</u>**
- 1,2,3,4, ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

(1) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) “අපගේ රජ්ජුරුවන් කුමාර කල මෙසේ වූ දොළෙක් විය.”

(අ) මෙසේ කියන්නේ කවරෙක් ද?
(ආ) මෙම පාඩම ඇතුළත් කතාව රචනා කිරීමේ අරමුණ කුමක් ද?

(ii) “උඹ දැන් ඉක්මන් කරලා ගමට යන එකයි වඩා හොඳ”

(අ) මෙහි ‘උඹ’ යනුවෙන් අමතන්නේ කවුරුන් හටද?
(ආ) මෙම පාඨය ඇතුළත් මුල් කෘතියේ කතුවරයා කවුද?

(iii) හේනේ පැලේ මා විඳිනා සුරුක්කන්
ඌරෝ ඇවිත් වට පිට කරති සක්මන්

(අ) ගොවියා පැල් රකින්නේ කවර භෝගයක් ආරක්ෂා කිරීමට ද?
(ආ) මෙහි දැක්වෙන පරිදි ගොවියා මුහුණ පාන අභියෝගය කුමක් ද?

(iv) (අ) හංස සන්දේශයේ නිමිත්ත වනුයේ කිනම් රජ කෙනෙකු වෙත සෙත සැලසීම ද?
(ආ) රසවාහිනියෙහි “වත්ථුල පබ්බත” නමින් හඳුන්වා ඇති ගම කුමක් ද?

(v) ඇස නැති දා පොත ගත්තේ කියන්ට ද
දත නැති දා උක් දඬු ගිනි තපින්ට ද
...............................................................
...............................................................

(අ) මෙම කවියේ ඉතිරි පද පේළි දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙම ජනකවිය කෙබඳු ජනකවි වර්ගයට අයත් ද?

(vi) “දැන් රජ ඔහු ගන්නට යෙයි. කුමක් කටයුත්තෙ යැ”

(අ) මෙම පාඨය කවරෙකු අමතා කියූවක් ද?
(ආ) ‘ඔහු’ යන්නෙන් අදහස් වන්නේ කවරෙක් ද?

(vii) **නිදහස මහ මුහුදක් වේ**
එහි උල්පත පුත, නුඹ වේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ ඇතුළත් කාව්‍යාලංකාරය කුමක් ද?
(ආ) මෙම පද්‍ය කොටස ඇතුළත් පැදි පෙළ රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

(viii) පන් සිළු වීණා නද පසු බැස්වූ
මන් පිනවන වේණු නදයෙන් තොස්වූ
නන් දන කැන් දුටුව ද බිය සිස්වූ
මින් රළවුත් ගං වෙරළට රැස්වූ

(අ) ඉහත පද්‍ය ඇතුළත් කෘතිය රචනා කරන ලෙස ආරාධනා කරනු ලැබුවේ කවරෙකු විසින් ද?
(ආ) මේ පද්‍යට අනුව පසු බස්වන ලද්දේ කවරෙකුගේ වීණා නාදය ද?

(ix) “සිහි වේ හැම කල් හද සෝකෙන්
සමා වනු ඇත වරදා”

(අ) මෙය කාගේ ප්‍රකාශයක් ද?
(ආ) එසේ පැවසීමට හේතුව කුමක් ද?

(x) පහත දැක්වෙන සාහිත්‍ය ග්‍රන්ථ රචනා කරන ලද කතුවරුන් සඳහන් කරන්න.

(අ) මළවුන්ගේ අවුරුදු දා
(ආ) එළු අත්තනගලු වංශය

(ලකුණු 2 × 10 = 20යි)

(2) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) “එකල්හි ගොන් රක්නාහු, වස්සන් රක්නාහු, සහන්නාහු, ගමන් යන්නාහු බුදුන් එකලා වැ බුදු රැස් නො විහිදැ වඩනුවන් දැකැ නො හැඳිනැ “ මහණ, එ මහට නො යා. එ මහැ අඟුල්මල් නම් සොරෙකැ,”

(අ) මාර්ගයේ දී බුදුන් වළකාලීමට උත්සාහ කළ දෙපිරිසක් නම් කරන්න.
(ආ) මේ සොරා අඟුල්මල් යන නමින් හැඳින්වූයේ ඇයි?

(ii) ම හ නි ල මි න් සිටි නා දොඹ නී පියල
පි ය ස ල මි න් මලගෙහි කෙළැ රොනින’වල
ත තු ඩ ල මි න් බිඳැ **විලිකුන්** මියුරු පල
**ඉ සු ඹු ල මි න්** යෙහි සැළ! දඹ පඳුරුවල

(අ) මහ දිගට සෙවණ සලසමින් වැඩුණු ගස් වර්ග නම් කරන්න.
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

(ii) “නැඟී සිටුව! ආචාරිනී, මා නො වඳුව” කියා මහ බෝසතාණන් වහන්සේ බැණ නැඟී හඬ සියලු චතුරංගනී සේනායෙහි අරගල මැඬ ගෙන සිටියේ ය.”

(අ) චතුරංගනී සේනාව නම් කරන්න.
(ආ) මෙම ප්‍රකාශය සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iv) සිනිඳු මොළොක් බව මලෙහී
පිරිසිදු බව පිනි බිඳෙහී
එක් වී මා පුතුගෙ ළෙහී
අරක් ගනී හැම දිනෙහී

(අ) මොළොක් බව හා පිරිසිදු බවට ආවේණික වස්තූන් දෙක පිළිවෙළින් දක්වන්න.
(ආ) මොළොක් බව හා පිරිසිදු බව සදාකල්හි ම පවතින්නේ කොතැනක ද?

(v) “ඒ විද්දත් දූත් නො බෝ කලෙකින් සිටුපුත් හට පුතකු වදා-පියා නළවන කල “ගැල් රකිනවුගේ පුත” “බර උසුලන්නවුගේ පුත,” “කුමකුත් නො දත්තවුගේ පුතැ”යි කිය කියා නළවයි.”

(අ) මෙහි සඳහන් සිටු පුත්‍රයාගේ නම කුමක් ද?
(ආ) බිරිඳගේ ගර්හාවට ලක් වූ සිටු පුත්‍රයාගේ කාර්යයන් දෙකක් ලියන්න.

(ලකුණු 4 × 5 = 20යි)

(3) සතර කන් මන්ත්‍රණයේ එන මහෞෂධ පණ්ඩිතයන්ගේ චරිතයෙන්
(I) දුර දක්නා නුවණත්,
(II) ස්ථානෝචිත ප්‍රඥාවත් ප්‍රකට කෙරෙයි
එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් මෙම කරුණු විසමන්න.

නැතහොත්,

(I) ස්වාභාවික සිදුවීම් අපූර්වත්වයට නැඟීමත්,
(II) අනුප්‍රාසාත්මක පද භාවිතයත්,
වීණා වාදනයෙහි මිහිරියාව ඉදිරිපත් කිරීමේ උපක්‍රම ලෙස ගුත්තිල කවියා භාවිත කොට ඇති ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන සාකච්ඡා කරන්න.

(ලකුණු 15යි)

(4) (I) නොසැලෙන ධෛර්යයකින් යුක්ත වූත්,
(II) අසීමිත පති භක්තියකින් හෙබි
කාන්තාවක ලෙස බැද්දේගම නව කතාවේ එන පුංචිමැණිකාගේ චරිතය හඳුනා ගත හැකිය.
එක් කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න.

නැතහොත්,

කුරක්කන් වගා කිරීමේ සිට අස්වනු නෙළා ගැනීම තෙක් ගොවියා විඳින
(I) විඳි දුක්ගැහැට
(II) අභියෝග ජයගත් ආකාරය පිළිබඳව ''කුරහන් ඉසිමුව කළුවර බලාලා'' පද්‍ය පන්තිය තුළින් නිරූපණය වන අයුරු එක් කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

• 5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.

(5) හාස්‍ය, උපහාසය හා අනුකම්පා සහගත චරිතයක් ලෙස උග්ගසේන සිටු පුත්‍රයාගේ චරිතය නිරූපිතය. මෙම කියමන නිදසුන් තුනක් දෙමින් විමසන්න.

(ලකුණු 10යි)

(6) කාව්‍යෝපක්‍රම භාවිතය තුළින් මනරම් කාව්‍ය සංකල්පනා ඉස්මතු කිරීම සැළලිහිණි සන්දේශ කතුවරයා දක්වන සමත්කම නිදසුන් තුනක් දක්වමින් විමසන්න.

(ලකුණු 10යි)

(7) අජීවි වස්තුන්ට ජීවත්වයක් ආරෝපණය කිරීම ''ගංගාවේ සංගීතය'' පැදි පෙළ රසවත් කාව්‍ය නිර්මාණයක් වීමට හේතු වී ඇත. උදාහරණ තුනක් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 10යි)

★★★